ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82

දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා
නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2568 2025 ජනවාරි 13 දුරුතු කළාපය

**දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති**
**ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරාධිකාරී,**
**කොළඹ නාලන්ද මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය,**
**ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# “නිතර කුසල් කරමු ”

**( ධම්ම පදය - පුප්ඵ වග්ග)**

සුපින්වතුනි,

අඟුරට භද්දිය නුවර විසූ මෙණ්ඩක නම් අමිතභෝගී සිටුවරයාගේ පුතා වන ධනංජය හා ලේලිය වූ සුමනා යන දෙපළට උපන් දියණිය විශාඛා නම් වූවාය. බුදුහිමි භද්දිය නුවරට වැඩම කළ අවස්ථාවක සිය මුත්තණුවන් වූ මෙණ්ඩක සිටුවරයා සමග බුදුන් දැකීමට ගිය විශාඛා සත් හැවිරිදි වයසේදීම සෝවාන් වූවාය. වැඩි වියට පත් ඕතොමෝ සැවත් නුවර මිගාර සිටුවරයාගේ පුතා වන පූර්ණවර්ධන සමග විවාහ විය. මිගාර සිටු පවුල නිගණ්ඨ නාතපුත්තගේ අනුගාමිකයෝ වූහ. විවාහ මංගල දිනයෙහි මිගාර සිටුවරයා නග්න ශ්‍රමණයන් පන්සියයක් ගෙන්වා ඔවුන්ට දන් පිළිගැන්වීම සඳහා එන්නැයි විශාඛාවට දන්වා යැවීය.නිරුවත් පැවිද්දන් දුටු ඇය “රහත්හු මෙසේ නොකරති, විලිබිය නැත්තෝ නොවෙති, කුමක් නිසා මා මෙහි කැඳවීදැයි’ අසා ආපසු තමන් වසන තැනට ආවාය. මේ කරුණ නිසා උරණ වූ නග්න ශ්‍රමණයෝ “කුමක් නිසා මෙබඳු තැනැත්තියක මෙහි ගෙනාවෙහිද? වහාම ඇය නිවසෙන් නෙරපා දමන්නැයි” කීහ. මිගාර සිටුවරයා අමනාප නොවන ලෙස ඔවුන්ට පවසා දන් වළඳවා ආපසු යැවීය. සිටුතුමාද රන් පිඟානකට මඟුල් කිරිබත් බෙදවාගෙන

උස් ආසනයක හිඳගෙන අනුභව කරන්නට පටන් ගත්තේය. ඒ වේලෙහි පිඬු පිණිස පැමිණි භික්ෂුවක් ගෙයි දොරකඩ හිඳිනු දැක දැකම මාමණ්ඩිය කිරිබත් කන නිසා "ස්වාමීනි, අපේ මාමණ්ඩිය පුරාණය වළඳනවා. ඔබ වහන්සේ වෙනත් නිවසකට වඩින්න" යැයි විශාඛාව කීවාය. අශුචිවලටද 'පුරාණ' යැයි කියන බැවින් ලේලිය තමාට අපහාස කළැයි කිපුණු මිගාර සිටුවරයා විශාඛාව වහාම නෙරපා හරින ලෙස ගුගුළේය.

"හිතුමතේට එසේ කළ නොහැක. මා මෙහි එනවිට මාපියන් විසින් එවන ලද පණ්ඩිතයෝ දස දෙනෙක් වෙති. මා අත වරදක් තිබේ දැයි ඔවුන්ගෙන් විමසා බලන්නැ'යි විශාඛාව කීවාය. මිගාර සිටුවරයා ඒ පණ්ඩිතවරුන් ගෙන්වා විචාල විට විශාඛා කිවේ 'තම මාමණ්ඩිය පුරාණයේ කළ පිංවල එල භුක්ති විඳිනවා මිස මේ ජීවිතයේ කිසි පිනක් නොකරන බව කිවෙමි'යි පැහැදිලි කළාය. විශාඛා නිර්දෝෂීභව ඔප්පු විය.

විශාඛාව පසු දිනෙක මිගාර සිටුවරයාගේ අවසරය ඇතිව බුදුරදුන් ඇතුළු පන්සියයක් සංඝරත්නය සිටුමැදුරට වඩමවා දන් දුන්නාය. මිගාර සිටුවරයාට බණ අසන්නට පැමිණෙන ලෙස ආරාධනා කළත් මුල් දේවතාවෙ නොපැමිණ තෙවැනි වර පැමිණ තිරයක් පිටුපස හිඳ බණ ඇසීය. ඒ බව දත් බුදුරජාණන්වහන්සේ මිගාර සිටුවරයා අරමුණු කරගෙන ධර්ම දේශනා කළහ. දේශනාව අවසන සිටුවරයා සෝවාන් විය. මැය මගේ ලේලිය නොවේ. අද පටන් ඇය මගේ අම්මාය යි මිගාර කිවේය. එදා පටන් මිගාර මාතා නම් වුවාය. පසු දින එසේම දන් දුන්නේය. එදින නැන්දා සෝවාන් වුවාය. විශාඛාවට පියාගෙන් දායාද වශයෙන් ලැබුණු මේල පළඳනාව නිතර පැළඳීමට අපහසු බර වැඩි එකක් වූ නිසා මිගාර සිටුවරයා ලේලිය ගැන තමා තුළ ඇති ප්‍රසාදය දැක්වීම සඳහා 'ඝණමට්ට' නම් රන් ලක්ෂයක් වටිනා ආභරණයක් තනවා බුදු පාමොක් මහසනඟන ඉදිරිපිට දී ඇයට එය පැළඳවීය.

විශාඛාවට පුතුන් දසදෙනකු ද, දූවරුන් දසදෙනකු ද ලැබුණි. දිනක් මේල පළඳනාව පැළඳ ජේතවනාරාමයට ගිය විශාඛාවට බණ අසා ආපසු එද්දී ගලවා තැබූ තැනින් පළඳනාව ගැනීමට අමතක විය. මගදී එය මතක් වූ විශාඛාව දාසියකට එය ගෙන ඒමට නියම කොට මා එය ගලවා තැබූ තැනම තිබුනොත් රැගෙන එන ලෙසත්, වෙනත් තැනක තිබේනම් නොගෙනෙන ලෙසත් උපදෙස් දුන්නාය. ආනන්ද හිමියන් විසින් ආරාක්ෂාව සඳහා එය වෙනත් තැනෙක තබා තිබුණි. දාසිය ඒබව විශාඛාවට දැන්වූවාය. දැන් එය මට අයත් නොවේ. එය මහා සංඝයාට අයතිය. සංඝයාට මෙයින් පලක් නැති හෙයින් සංඝයා වෙනුවෙන් එය වෙන්දේසි කොට ලැබෙන මුදලින් බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට විහාරයක් කරවමියි සිතූ විශාඛාව, එසේ වෙන්දේසි කොට ගත මුදලින් පූර්වාරාම නම් වූ මිගාරමාතු ප්‍රාසාදය කරවූවාය. එය පූජා කරන දිනයෙහි විශාඛාව තම පිරිවර සමග සැදැහැ ගීත ගයමින්, බුදුගුණ කියමින් විහාරය පැදකුණු කළාය. භික්ෂූන් ඒ බව බුදුහිමියන්ට දැන්වූ විට උන්වහන්සේ මේ ගාථාව දේශනා කළහ.

මල් මාලා හදන කෙනෙක් නොයෙක් පැහැති මල් ගෙනවුත් ඒවා පිළිවෙලකට ක්‍රමානුකූලව අමුණා ලස්සන මල් මාලා සාදන්නාක් මෙන් මෙලොව උපන් තැනැත්තා විසින් අතරක් නොතබා, කුසල් දහම් රැස් කළයුතු බව ඉහත කී ගාථාවේ සරල තේරුමයි.

නරක අකුසල ධර්ම, පාප ධර්ම දුරුකරන නිසා 'කුසල්' යනුවෙන් හැඳින්වේ. සිත, කය, වචනය යන තුන්දොරෙන් සිදුවන ලාමක අකුසල් දුරු කොට හැම විටම කුසලයෙහි සිත යොදවා වාසය කිරීමට අප සියලු දෙනා පුරුදු විය යුතුය. නරකාදිය, තිරිසන් අපාය, ප්‍රේතලෝකය, අරූපලෝක සතර හා අසංඥතලය යන අට තැනෙක උපන්නොත් කුසල් කළ නොහැක. මේ අටෙන් මිදී සිටින ඔබ කුසලයට පමා වන්නේ ඇයි? අතරින් පතර කුසලයක් දෙකක් කළ සමහරු තමන් බොහෝ පින් කර ඇතැයි කියති. එය මුළාවකි. ඒවා විපාකදී අවසන් වනවිට යළි දුකට පත් වේ. ඒබැවින් නිතර කුසල් කරගෙන තිබුණොත් අකුසල්වල දරුණු විපාක හෙවත් දුගතියෙහි ඉපදීම වැළකී සුගතියෙහි උපත ලද හැකිය. පැරණි අකුසල කර්මවල ප්‍රතිසන්ධි විපාක දුර්වලවී, ප්‍රවෘත්ති විපාක පමණක් ලැබෙන පරිදී අකුසල කර්ම බලය මැඩලිය හැකි වන්නේ නිතර කුසල් කිරීමෙනි. ඒ සඳහා වයස් සීමාවක්, තැනක් නැත. ඕනෑම අවස්ථාවක ඕනෑම තැනක සිට කුසල් කළ හැකිය. අවශ්‍ය වන්නේ නුවණ මෙහෙයවීම පමණි.

අංගුත්තර නිකායේ, තික නිපාතයේ, දේවදූත සූත්‍රයේ මෙලොවදී පින් දහම් නොකර, හිස් අතින් පරලොව යන අයෙකුට අත්වන ඉරණම පෙන්වාදී ඇත. ජරා, ව්‍යාධි, මරණ යන දේවදූතයන් තිදෙනා දැක, මේ ලබාගත් මිනිස් දිවියෙන් හැකිතරම් කුසල් රැස් කර ගැනීමට සිතට ගත යුතුය. මීළඟ ජීවිතයේ පින් කළ හැකි තැනක අප උපදීදැයි නිශ්චිතව කිව නොහැක. ඒ නිසා ලැබෙන සෑම අවස්ථාවකම අකුසලය වළකා කුසලයට සිත යොමු කළ යුතුයි. අප ජීවත් වන විට අතීත සංසාරයේ කළ කුසල් විපාක දී ගෙවී යයි. එබැවින් ඒ අඩුව හැම විටම පුරවා තැබිය යුතුයි. වතුර ටැංකියක වතුර පිටවන බටය පමණක් විවෘත කර තිබුණොත් ටැංකිය හිස් වෙනවා . වතුර පිරෙන බටයත් ඒ සමග විවෘත කර තිබුණොත් හිස්වෙන හිස්වෙන තරමට යළි යළිත් වතුර පිරෙනවා. පිණත් එහෙම තමයි. කාන්තාර මාර්ගයක යන කෙනෙක් ස්වල්ප වූ ආහාර පාන රැගෙන ගියොත් කාන්තාරය මැදට යනකොට ඒවා අවසන් වී පුද්ගලයා මරණයට හෝ ඒ හා සමාන දුකකට හෝ පත් වෙනවා. දිය බින්දුව බින්දුව වැටී කළය පිරෙන්නා සේ දිනපතා හැම මොහොතකම සිත, කය, වචනය යහපත් දේට යොමු කර දස කුසල්, පුණ්‍යක්‍රියා අතුරින්, සුළු වූ හෝ යහපත් දෙයක් කරන්නට මේ පින්වතුන් උනන්දු විය යුතුයි.

පින් කරන කෙනෙකුට ඒ සඳහා මේ සමාජයේ අවස්ථා තියෙනවා. නිවසේ දිනපතා බුද්ධ පූජාව පවත්වන්න පුළුවන්, ක්‍රෝධය, වෛරය, ඉරිසියාව, මාන්නය දුරු කොට සැමට මෙත් වන්න පුළුවන්, පන්සිල් රැකගෙන පිරිසිදු ජීවිතයක් ගත කරන්න පුළුවන්. මෙබඳු අවස්ථාවන් නුවණින් දැක කටයුතු කිරීම තමයි බොහෝ අයට නැත්තේ.

ඔබ සැමත් දිය පිරි කළයක් මෙන්, ලස්සන මල් දමක් මෙන් පිනෙන් පිරෙන්න, කුසලයෙන් වැඩෙන්න උත්සාහ කරන්න.